එක්සත් ජනපද තානාපති කාර්යාලය ඉෆ්තාර් භෝජන සංග්‍රහයක් පවත්වයි.

ජුනි 28, 2016: ඇමෙරිකානු තානාපති අතුල් කෙෂප් විසින් ශ්‍රී ලාංකික මුස්ලිම් නායකයින්, රාජ්‍ය නිලධාරීන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ ජනමාධ්‍ය නියෝජිතයින් වෙනුවෙන් ඉෆ්තාර් භෝජන සංග්‍රහයක් ඊයේ රාත්‍රී පවත්වන ලදී.

මේ වසරේ රාමසාන් උත්සවය වෙනුවෙන් ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් මෙවැනි භෝජන සංග්‍රහ තුනක් පවත්වනු ලබන අතර යාපනයේ සහ ෆාතිමා ළමා මධ්‍යස්ථානයේදී අනෙක් සංග්‍රහ පැවැත්වේ.

"රාමසාන් මගින් ලොවට දෙනු ලබන වැදගත් පණිවිඩය යළිත් අවධාරණය කරනු ලබන අතර, ශ්‍රී ලාංකික ජනතාව මෙරට සියලු දෙනාටම සාමයෙන් සහ සමානත්වයෙන් යුතුව ජීවත්විය හැකි අනාගතයක් ඇති කර ගැනීම සඳහා පෙන්වා ඇති කැපවීමද අගය කරමි" තානාපති අතුල් කෙෂප් පැවසීය.